# මිශ්‍ර ප්‍රශ්ණ පත්‍රය අංක 18 - (2023)
# 5 - ශ්‍රේණිය

**(1)** නිවාස පෙළක විනුකගේ නිවස ඇත්තේ දකුණු පස සිට දසවන ස්ථානයේ ය.මිනුලිගේ නිවස ඇත්තේ වම් පස සිට හයවන ස්ථානයේ ය.විනුකගේ නිවස සහ මිනුලිගේ නිවස අතර තවත් නිවාස අටක් පිහිටා ඇති නම් එම නිවාස පෙළෙහි ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද?

(1 )16 (2) 22 (3) 24

**(2)** පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය අඩංගු පිළිතුර තෝරන්න.

(1) ඇතැම් විට දිවා කාලයේ දී ඉර හා හඳ දෙකම අහසේ දැක ගත හැක.
(2) ගුරුවරුන්ට සියලු දේවල් පිළිබඳව අවබෝධයක් ඇත.
(3) ශරීරයට ලැබෙන ව්‍යායාම අඩු වීම ලෙඩ රෝග වැඩි වීමට හේතුවකි.

- පහත 3 හා 4 ප්‍රශ්නයන්හි ඉරි ඇදී පදයට ගැලපෙන විරුද්ධාර්ථ පදය තෝරන්න.

**(3)** වනයේ **ලස්සන** කුරුල්ලෝ සිටිති.

(1) හුරතල් (2) අහිංසක (3) අවලස්සන

**(4)** සමහර සත්තු මිනිසා සමඟ වැඩ කිරීමට **පුරුදු** වී සිටී.

(1) නුපුරුදු (2) කැමති (3) අකමැති

**(5)** පහත සඳහන් අදහස කියවෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

යමක් කිරීමට උත්සාහ කර එය කරගත නොහැකි විට එහි අගුණ කීම.

(1) උපාසක බළල්ලු මීයන් දෙන්නා දෙන්නා අල්ලනවා වාගේ.

(2) අවුරුදු කන්න ගිහින් බඩගින්නේ ආවා වගෙයි.

(3) නරියා මිදි තිත්තයි කිව්වා වගේ.

**(6)** පහත අදහස කියවෙන ඉඟි වැකිය තෝරන්න.

රවටනු පිණිස වර්ණනා කිරීම.

(1) මුරුංගා අත්තේ තැබීම

(2) ඉවසීමෙන් සැනසීම ලැබේ.

(3) ඉබි කටුත් බෙහෙතට ඔනැවීම.

**(7)** පහත සඳහන් අදහස කියවෙන ආප්තෝපදේශය තෝරන්න.

ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න.

(1) අවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

(2) පනින්න පෙර සිතා බලනු.

(3) අව්ව තිබියදී පිදුරු වේලා ගත යුතුයි.

**(8)** පහත සඳහන් කවියෙහි හිස්තැනට ගැලපෙන පදය තෝරන්න.

**සමන්පිච්ච මල් ඉහිරුණු**

**නිල් තණ කොළ පිට්ටනියක්**

**වගෙයි අහස අන්න බලනු**

**...................................**

(1) කොච්චර ලස්සනද අහස

(2) කොච්චර ලස්සනද රැට

(3) මා වවුලෝ කෑ ගසති.

**(9)** දී ඇති වැකිය ඒක වචනයට හරවා ඇති පිළිතුර තෝරන්න.

ඔවුහු හොඳ වැඩ කරති.

(1) ඔහු හොඳ වැඩ කරති.

(2) ඔහු හොඳ වැඩ කරයි.

(3) ඔවුහු හොඳ වැඩ කරයි.

**(10)** දී ඇති වැකිය ලිඛිත බසට හරවා ඇති පිළිතුර තෝරන්න.

වඩු කිරිල්ලී අලංකාර නිර්මාණයක් කළා.

(1) වඩු කිරිල්ලී අලංකාර නිර්මාණයක් කළා ය.

(2) වඩු කිරිල්ලී අලංකාර නිර්මාණයක් කළේ ය.

(3) වඩු කිරිල්ලී අලංකාර නිර්මාණයක් කරති.

ප්‍රකාශන හිමිකම © 2023 A3BOOK. සියලු හිමිකම් ඇවිරිණි web : www.a3book.com

- 11 සිට 16 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණද වැරදි නම් (X) ලකුණද යන්න තෝරන්න.

**(11)** මා නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජන ලැබුවෙමි. ( )

**(12)** අප පෙරහැර දෙස බලා සතුටු වුණෙමු. ( )

**(13)** ඔවුහු විභාගයට සූදානම් වෙති. ( )

**(14)** ඈ පාරේ ගමන් කළාය. ( )

**(15)** නැව් ඈත මුහුදේ ගමන් කළෝය . ( )

**(16)** ගෙවිලියෝ ඇඹුල රැගෙන කමත දෙසට ගියෝය. ( )

- ප්‍රශ්න අංක 17 සහ 18 ප්‍රශ්න වල දී ඇති වැකි වල අර්ථය සිංහලෙන් නිවැරදිව ලියා ඇති වැකිය තෝරන්න.

**(17)** Where are you going?

(1) ඔබ යමින් සිටින්නේ කොහෙද? (2) ඔබ ගියේ කොහෙද? (3) ඔබ ගෙට යන්නේ කොහෙද?

**(18)** I am going to the temple

(1) මම ගෙදර යනවා. (2) මම පන්සල් යනවා. (3) මම පන්සල් ගිහින් එනවා.

- ප්‍රශ්න අංක 19 සහ 20 ප්‍රශ්න වල දී ඇති වැකි වල අර්ථය ඉංග්‍රීසියෙන් නිවැරදිව ලියා ඇති වැකිය තෝරන්න.

**(19)** ඔවුන් කොහේද?

(1) Where are they? (2) Where are you.? (3) what are them?

**(20)** මේ කව්ද?

(1) Who is it? (2) Who is this? (3) What is this?

ප්‍රකාශන හිමිකම © 2023 A3BOOK. සියලු හිමිකම් ඇවිරිණි web : www.a3book.com

# පිළිතුරු පත්‍රය.

1) 3
2) 1
3) 3
4) 1
5) 3
6) 1
7) 1
8) 2
9) 2
10) 1
11) ✕
12) ✕
13) ✕
14) ✓
15) ✕
16) ✓
17) 1
18) 2
19) 1
20) 2

(ලකුණු 5 x 20 = 100)

a3book.com

ප්‍රකාශන හිමිකම © 2023 A3BOOK. සියලු හිමිකම් ඇවිරිණි web : www.a3book.com